

# මලී.....

## අම්මා කියන දේ අහන්න.

රුහන්සා දහම්දී රූපසිංහ

කෘතියේ නම - **මලී අම්මා කියන දේ අහන්න...**

**ISBN** අංකය -**ISBN** 978-624-208-101-4

කතෘගේ නම - රුහන්සා දහම්දී රූපසිංහ

කෘතිය පළ කරන දිනය -2023.12.10

# පිදුම

මාගේ දෙමව්පියන්ට

සහ

උදවු කල සියලු

දෙනාට ආදරෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

එකෝමත් එක දවසක මලී තනියම කැලයට යන්න ගියා. ඔහොම ඉන්න මලී..... ,ඇයි අම්මා....

තනියම කැලයට යන්න එපා.

එතකොට කවුරු හරි අඳුරන්නේ නැති කෙනෙක් ඇවිල්ලා ඔයාව අල්ලාගෙන ගියොත් එහෙම.......

නෑ අම්මේ...

අම්මා බය වෙන්න එපා.

මම පරිස්සමෙන් ගිහින් එන්නම්.



පුංචි මලී හෙමින් හෙමින් කැලය ඇතුළට ගියා.

ටික දුරක් යනකොටම හම්බවුණා ලස්සන මල් වත්තක්,

ඒ මල් වත්තේ මල් නම් හරිම සුවඳයි.

ඔන්න ඉතින් මලී මල් ළඟට  ගියා....

මල් ළඟට යනකොටම මලී ලිස්සලා වැටුණා.

කවුදෝ අඳුරන්නේ නැති  ලස්සනම ලස්සන කෙනෙක් මලීට උදවු කරන්න ආවා.



කවුද ඔයා.....?

මම තමයි මේ ලෝකෙ ඉන්න ලස්සනම සුරඟන.....

අනේ මට උදවු කරන්නකෝ සුරංගනාවිය.

හොඳයි, මම ඔබට උදවු කරන්නම් දරුවා.

අනේ ස්තූති සුරඟන....

ස්තූති කරන්න ඕන නෑ දරුවෝ...

ඇයි ඒ සුරඟන...?

මම සුරංගනාවියක් නිසා ඔයා මට ස්තුතියි කරන්න එපා.

ඔයා නම් හරිම හොඳ දරුවෙක්.

ඔයාගේ නම මොකක්ද දරුවෝ?

මගේ නම මලී....

ආ..මලී කියන නම නම් හරිම ලස්සනයි.

අනේ ඔයා සින්දුවක් කියන්නකෝ මලී...

හා...මං කියන්නම් සුරඟන.

එහෙනම් කියන්නකො බලන්න.

නිල් අහස් තලේ අගේ...

නෑ...වළාකුලු....ලා...ස්සනයි පුරා හදේ....රැස් විහීදිලා....

හරිම ලස්සනයි මලී...

මට ඔබේ ගෙදර බලන්න ඕන... මලී සුරඟනට කිවුවා.

මට ගෙදරක් නෑ මලී....

එතකොට ඔබ කොහෙද ජීවත් වෙන්නේ...?

මම ජීවත් වෙන්නේ ලස්සනම ලස්සන මලක,

ඒ මල රතුම රතු පාටයි.

ඒ මලේ පෙති ගොඩක් තියනවා.

අනේ මට ඒ මල පෙන්නන්නකෝ...

හා හොඳයි,මං පෙන්වන්නම්කෝ...

ඔන්න ඉතින් මලී සුරඟන එක්ක ගියා.

ටික ටික මහන්සි පාටක් දැනුනා.

අනේ සුරඟන...මට නම් හරිම මහන්සි...

මට ටිකක් විවේක ගන්න පුලුවන්ද?

පුළුවන් දරුවෝ....

අපි ගහක් යටට වෙලා විවේක ගමු.

ඊට පස්සේ  දෙන්නම ගහ යට ඉඳගත්තා....

ඔන්න  ඉතින් දෙන්නම  ටික ටික සුරඟනගේ නිවසට ලං වුණා...

කොහොම හරි ගිමන් හරිමින් එතනට ගියා.



ඔන්න අපි ආවා.... ,සුරඟන කිවුවා.

මලීට හරිම සතුටුයි.

මේ තමයි මගේ ගෙදර....

ඒත් කොහොමද මම මේ ගෙදර ඇතුලට යන්නේ....

මල් ඇතුලේ ජීවත් වෙන්නේ සුරංඟනාවියන් විතරයි

සුරඟන මලීට කිවුවා.

ඔන්න මම මගේ ගෙදර පෙන්නුවා...

ලස්සනයි නේද? සුරඟන ඇසුවා.

ඔව් සුරඟන...

ගොඩාක් ලස්සනයි...

එහෙනම් මම දැන් මගේ ගෙදර යන්න ඕනේ..මගේ අම්මා මම එනකල් බලාගෙන ඇති.

ඔබට බොහෝම ස්තූතියි....මේ කැලයේ ලස්සන මට පෙන්වූවාට..

ආයේ දවසක අපි මුණ ගැසෙමු මලී....

හැබැයි අම්මා කියන දේ අහන්න ඕනේ...අම්මා එපා කියන දේ කරන්න හොඳ නෑ.

හොඳමයි සුරංගනාවිය.....

මම ආයේ කවදාවත් අම්මට අකීකරු වෙන්නේ නෑ.


ඒක ගොඩක් හොඳයි දරුවෝ.

මම ආයේ එනකොට ඔයාට තෑග්ගකුත් ගේන්නම් මලී...

ඔන්න මලී ගෙදර යන්න ගියා.

සුරංගනාවියත් ඇගේ නිවස ඇතුලට යන්න ගියා.

# නිමි.



**ISBN** 978-624-208-101-4

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01